සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 | S | I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම : ............................................. නර්තනය - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (5) ලකුණ යොදන්න.

---

1. රණශූරත්වය පිළිබඳ ගැයෙන ගායනා විශේෂය ..... නමින් හැඳින්වේ.
(1) සවරන් කවි (2) පන්තේරු කවි (3) හටන් කවි (4) උඩැක්කි කවි

2. ''තවද අත්තා මුත්තා නත්තා පනත්තා'' මෙම පද කොටස අයත් ගායනය ................. කි.
(1) වන්නම (2) ටීකාව (3) ප්‍රශස්ති (4) සැහැල්ල

3. රවුමට නටනු ලබන ශාස්ත්‍රීය පද විශේෂය ............ නමින් හැඳින්වේ.
(1) යක්කම (2) වන්නම් (3) මංගලම් (4) වට්ටම්

4. රත්නපුර මහසමන් දේවාල පෙරහැරේ දී ....... නැටුම් සඳහා විශේෂ තැනක් හිමි වේ.
(1) සබරගමු (2) උඩරට (3) කාවඩි (4) පහතරට

5. කෝලම් නාටක චරිත නිරූපණයේ දී .................. අතිමානුෂීය චරිත ලෙස සැලකේ.
(1) නාග රාක්ෂ, නාග කන්‍යා, සිංහ (2) නාග රාක්ෂ, නාග කන්‍යා, කාපිරි
(3) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, වලස් (4) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, නාගකන්‍යා

6. ශාන්ති කර්මවල භාවිතා කෙරෙන සංවාද හා සැරසිලි .... අභිනයන්ට අයත් වේ.
(1) ආංගික හා වාචික (2) සත්වික හා ආංගික (3) වාචික හා ආහාර්ය (4) ආහාර්ය හා සාත්වික

7. සකපෝරුව හා ඉල්ලම් ගැරීම......... කර්මාන්ත හා සම්බන්ධ වේ.
(1) ධීවර හා මැටි (2) කෘෂි හා කොහු (3) කොහු හා පතල් (3) මැටි හා පතල්

8. ලය ප්‍රභේද අනුව කරන නර්තනයක දී ඉතා වැඩි වේගය ................ ලෙස හැඳින්වේ.
(1) විලම්භලය (2) ධෘතලය (3) අතිධෘතලය (4) මධ්‍යලය

9. ආගමික කටයුතු සඳහා ..... වාදනය කෙරෙන අවනද්ධ භාණ්ඩ........................... වේ.
(1) ගැටබෙරය හා තම්මැට්ටම (2) දවුල හා හොරණෑව
(3) දවුල හා තම්මැට්ටම (4) තම්මැට්ටම හා උඩැක්කිය

10. පංචතූර්ය වාදන භාණ්ඩ අතරින් ....................... ඝන හා සුසිර භාණ්ඩ ගණයට අයත් වේ.
(1) තලිය හා තාලම්පට (2) පන්තේරුව හා බටනලාව
(3) හොරණෑව හා තාලම්පට (4) බටනලාව හා හොරණෑව

11. දේශීය නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස් කර ගැනීම සඳහා යොදා ගන්නා ආධාරකය වන්නේ
(1) අරමණ්ඩියයි (2) ලී ආධාරකයයි (3) දණ්ඩියමයි (4) කණ්ඩිලමයි

12. ගොඩ සරඹ නර්තනයේ දී සුරල් පැගීමෙන් කස්තිරම නටනු ලබන්නේ
(1) 9 වැනි ගොඩසරඹයේ සිටයි (2) 10 වෙනි ගොඩ සරඹයේ සිටයි
(3) 7 වෙනි ගොඩ සරඹසිටයි (4) 8 වෙනි ගොඩ සරඹයේ සිටයි

13. හාස්‍ය රසය දනවන ගායනා ඇතුළත් වන්නමකි.
(1) මුෂලඩි වන්නම (2) සැවුලා වන්නම (3) සිංහරාජ වන්නම (4) තුරඟා වන්නම

14. අස්නය නර්තනයේ දී භාවිතා වන රංග භාණ්ඩ වන්නේ
(1) පොල් පන්දම හා පුවක් කිනිත්ත ය. (2) පොල් පන්දම හා ඊ ගස ය.
(3) පන්දම හා පුවක් කිනිත්ත ය. (4) පොල් පන්දම හා පොල් කිනිත්ත ය.

15. පහතරට නර්තනාංග ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරනු ලබන්නේ
(1) මහනුවර දළදා පෙරහැරේය (2) කතරගම දේවාල පෙරහැරේදීය
(3) රත්නපුර මහසමන් දේවාල පෙරහැරේදීය (4) උපුල්වන් දේවාල පෙරහැරේදීය

16. ශාන්ති කර්මවල එන නාට්‍යයම පෙළපාලි තුළින් වඩාත් ම පිළිඹිබු වන රසය වන්නේ
(1) අත්භූත රසය යි. (2) ශාන්ත රසය යි.
(3) කරුණා රසය යි. (4) හාස්‍ය රසය යි.

17. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ගායනය සහිත නර්තන අංග දෙකකි.
(1) ආවැන්දුම හා මඩුපුරය (2) අස්නය හා හත්පදය
(3) අස්නය හා කොහොඹාහැල්ල (4) කොහොඹ හැල්ල සහ යක්තුන් පදය

18. ''හනික වරෙව් කොල්ලනේ'' ගීතය ඇතුලත් වේදිකා නාට්‍ය වන්නේ
(1) ජනේලය වේදිකා නාට්‍යය (2) විදුර වේදිකා නාට්‍යය
(3) බෙරහඬ වේදිකා නාට්‍යය (4) ගුරුතරුව වේදිකා නාට්‍යය

19. අඹරා හේවිසි සහ ගෙවැදුම් හේවිසි යන ශබ්ද පූජා විශේෂය පවත්වනු ලබන්නේ
(1) යාපහුව මාලිගයේය. (2) කතරගම දේවාලයේය
(3) නාථ දේවාලයේය (4) දළදා මාලිගාවේය.

20. සීතාහරණ නෘත්‍ය නාටකය නිෂ්පාදනය කරන ලද්දේ
(1) රවීන්ද්‍රනාත්තාගෝර් තුමාය (2) නිමල් වෙල්ගම මහතාය
(3) ශාන්තිදේවගෝසශ්ය (4) උදය ශංකර්ය




ඉහත සඳහන් රූප සටහන ඇසුරුකර ගනිමින් 21, 22, 23 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

21. ඉහත රූපසටහනෙහි 5 හා 7 අංකවලින් දැක්වෙන්නේ
(1) වෙනිවර කැරැල්ල, කන්වරය (2) කෙප්‍රඩි වළල්ල, වරපට
(3) වරපට, බෙරපුහුල (4) බෙරකඳ, කැපුම්හම

22. රූප සටහනෙහි 1 හා 8 අංකවලින් දැක්වෙන්නේ
(1) කෙපුඩි වළල්ල, බෙරලණුව (2) වරපට, කන්වරය
(3) බෙර කඳ, කෙපුඩි වළල්ල (4) කන්වරය, කාදුව

23. බෙර ඇසෙහි ආරක්ෂාව සඳහා යොදා ගනු ලබන්නේ
(1) බෙර වයනයයි (2) බෙර තට්ටුවය (3) බෙර පුහුලයි (4) සුරත්තට්ටුවයි

24. සේරමාන් කතා පුවත හා සම්බන්ධ ශාන්ති කර්ම දෙකකි.
(1) පහන් මඩුව හා කිරිමඩුව (2) දෙවොල් මඩුව හා පහන් මඩුව
(3) පහන් මඩුව හා සූනියම් යාගය (4) දෙවොල්මඩුව හා රටයකුම

25. උඩරට වන්නම් රචනා වූයේ
(1) මහනුවර යුගයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කාලයේය.
(2) මහනුවර යුගයේ පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේය.
(3) මහනුවර යුගයේ දෙවන රාජසිංහ රජුගේ කාලයේය
(4) මහනුවර යුගයේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ ය

26. ''තා තෙයි තා තෙයියත් තාම්'' යන පදය කියමින් නටනුයේ
(1) 11 වැනි පා සරඹයයි (2) 9 වැනි පා සරඹයයි.
(3) 7 වැනි පා සරඹයයි (4) 10 වැනි පා සරඹයයි.

27. ජීවන වෘත්තීන් මුල් කොටගෙන නිර්මාණය වූ ගැමි නැටුම් දෙකකි
(1) ලී කෙළි හා පන්තේරු (2) ධීවර හා පතල්
(3) පතුරු හා චාමර (4) පතුරු හා සවරන්

28. මහනුවර යුගයේ විමලධර්මසූරිය රජු සමයේ ලංකාවට පැමිණි ලන්දේසි ජාතිකයා වනුයේ
(1) රොබට් නොක්ස් ය. (2) ඉබන්බතූතා ය.
(3) ස්පිල් බර්ජන් ය. (4) රවීන්ද්‍රනාත්තාගෝර්තුමාය.

29. ''රටකට මවු සමඟින් එ නැව් නැග'' යන කවිපදය අයත් ගායනා විශේෂය වනුයේ
(1) රබන් කවි (2) ප්‍රශස්ති කවි (3) ඔන්චිලි වාරම් කවි (4) මෝල්ගස් කවි

30. අංග වර්ණ හා හැඩතල උපයෝගී කර ගනිමින් අවශ්‍ය ආකාරයට හැඩ ගැන්වීම හඳුන්වනු ලබන්නේ
(1) රංග වින්‍යාශය යනුවෙනි (2) අංග රචනය යනුවෙනි
(3) රංග රචනය යනුවෙනි (4) ආකාශ භාවිතය යනුවෙනි

## II කොටස උඩරට නර්තනය

31. ''සිරිගත්ත හඳුපත්ව මුදුනින්'' යන පද කොටස අයත් වන්නම ලෙස සැලකෙන්නේ
(1) සිංහරාජ වන්නම (2) තුරඟා වන්නම (3) මුසලඩි වන්නම (4) වෛරෝඩි වන්නම

32. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි 02 අතර
(1) කප් සිටුවීම - මිල්ල කැපීම (2) තොටමෙට යාම - මඩු පේ කිරීම
(3) මල පේ කිරීම - දළු මුර පිදීම (4) තොට පේ කිරීම - අයිලෙ යැදීම

33. මැදුම් මහ (3 + 4) දෙතිතට අයත් අඩව්වකි.
(1) තක් තකට තක රොං (2) තාකු තක්කුං තරිකිට තකුද තත් ජෙං
(3) තක් තොග තක තොග (4) තාත් ජිං තත් කත් ජිං තත් ජිං තත් තත්

34. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ගායනය සහිත හා රහිත ප්‍රධාන නර්තන අංග 02කි.
(1) කොහොඹා කැල්ල - යක් ඇනුම (2) අස්නේ - මඩුපුරය
(3) ආවැන්දුම - දුනුමාලප්පුව (4) යක්තුන් පදය - හත් පදය

35. ''තක්කඩ, ජික්කඩ, තොංගඩ - නංගඩ තත් ජිත් තොංනං තා'' යන කස්තිරම් කොටස් නටමින් අවසන් කරන ගොඩ සරඹ නාමය වන්නේ
(1) පැනීම් සරඹයයි (2) බමර සරඹයයි
(3) දෑත පෑගීම සරඹයයි (4) චන්ද්‍රිකා සරඹයයි.

36. දොංතකු දොංතකු දොං ජිං යන බෙර පදය අයත් වනුයේ

(1) මාත්‍රා 123+1234 දෙතිතට
(2) මාත්‍රා 12+12+1234 තුන් තිතට
(3) මාත්‍රා 12+12+123 තුන් තිතට
(4) මාත්‍රා 12+1234 දෙතිතට

37. උඩරට සම්ප්‍රදායට අයත් වන්නම් 18ට අමතරව නිර්මාණ වන්නම් ලෙස සැලකෙන්නේ

(1) මරගත වන්නම - කොවුලා වන්නම
(2) සමනල වන්නම - හංසා වන්නම
(3) මහ බෝ වන්නම - තිසරා වන්නම
(4) ගජගා වන්නම - මන්ත්‍රී වන්නම

38. උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් රංග වස්ත්‍රාභරණ වනුයේ

(1) ජටාව, පායිම්පත, ශිඛා බන්ධනය
(2) හඟල, අවුල්හැරය, රතු හැට්ටය
(3) හේලය, සැට්ටය, කෙමෙත්ත
(4) හැට්ටය, අවුල්හැරය, අත්පොට

39. කොහොඹා කංකාරියේ පුද ලබන ප්‍රධාන දෙවිවරු වන්නේ

(1) කොහොඹා දෙවි, මංගර දෙවි
(2) කොහොඹා දෙවි, දෙවොල් දෙවි
(3) කොහොඹා දෙවි, බංඩාර දෙවි
(4) වීරමුණ්ඩ දෙවි, දෙවොල් දෙවි

40. උඩරට නර්තන සම්ප්‍රදායේ දියුණුව උදෙසා කටයුතු කළ නර්තන ශිල්පියකු වන්නේ,

(1) එස්. පනීභාරත මහතා
(2) ජයසේන කේට්ටේගොඩ මහතා
(3) කේ.එස්. ප්‍රනාන්දු මහතා
(4) ඩී. ජී. හීන්නිළමේ මහතා

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 S II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම : ............................................... නර්තනය (දේශීය) - II කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

I පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

---

01. (i) ගද්‍ය, පද්‍ය කොටස් දෙකකින් සමන්විත ........................................ ගී පද ජන ගායනා විශේෂයකි.

(ii) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් අයිලය ....................................... ශාන්ති කර්මයේ ප්‍රධාන සැරසිල්ලකි.

(iii) හේවිසි වාදනය සඳහා දවුල, තම්මැට්ටම ....................................... යන වාද්‍ය භාණ්ඩ යොදා ගනී.

(iv) 1961 දී චිත්‍රසේනයන් විසින් නිර්මාණය වූ කලාත්මක මුද්‍රා නාට්‍යයක් ලෙස ................................. ඉතා සුවිශේෂී වේ.

(v) උඩරට නර්තන සම්ප්‍රදායේ යක් ඇනුම නර්තනය, ගායනය ............................................. නර්තනයකි.

(vi) තාල රූප දෙකකට ................................................. වන්නම නටනු ලැබේ.

(vii) සිංහල ජන නැටුමේ එන කළගෙඩි නැටුම දෙමළ ජන නැටුමේ .................................. ලෙස හඳුන්වයි.

(viii) උඩරට නැටුම් කලාව ........................................................ මහතාගේ කෘතියකි.

(ix) පහත සඳහන් වාද්‍ය භාණ්ඩ වාදනය කරනු ලබන නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(1) මෘදංගය ..............................................................

(2) මද්දලය..............................................................

(x) පහත දැක්වෙන නාට්‍යමය හා නර්තන අවස්ථා ඇතුළත් ශාන්ති කර්ම 02 නම් කරන්න.

(1) දුනුමාලප්පුව ........................................................

(2) අසුර යක්කම .......................................................

02. (i) දෙසුළු මැදුම් තුන්තිතට $(2 + 2 + 3)$ අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.

(ii) ''රනේ රුවසෙ වත රුවින් දිලේදෝ''.......... යන මෝල්ගස් කවිය මාත්‍රා $3\ (3 + 3)$ තනි තිතට ප්‍රස්ථාර කරන්න.

(iii) සිංහරාජ වන්නමේ අඩව්ව ප්‍රස්ථාර කරන්න.

03. (i) පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(1) ග්‍රහ පංති කවි

(2) සරල අංගරචනය

(3) ආහාර්ය අභිනය

(4) හේවිසි වාදන

04. (i) සොකරි හෝ කෝලම් නාටකය පැවැත්වීමේ අරමුණු 2ක් ලියන්න.

(ii) සොකරි හෝ කෝලම් නාටකවල ඔබ කැමති එක් කාන්තා චරිතයක් පිළිබඳ විස්තර කරන්න.

(iii) ගැමි නැටුම් හා ගැමිනාටක වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණ පෙන්වා දෙන්න.

05. ''සිංහල ශාන්ති කර්ම පද්ධතිය වූ කලී සමාජ සාරධර්ම හා ආකල්ප මත බැඳී පවතින්නකි.''

(i) පහන් මඩුවේ පූර්ව චාරිත්‍ර 2ක් නම් කරන්න.

(ii) උඩරට කොහොඹා කංකාරියේ රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.

(iii) ශාන්ති කර්ම පැවැත්වීමේදී සමාජ සහයෝගය ලැබෙන ආකාරය පිළිබඳ විස්තර කරන්න.

06. පහත දැක්වෙන රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය



B රූපය

(i) A රූපයේ දැක්වෙන ශාන්ති නිකේතනයේ නිර්මාතෘවරයා නම් කර එතුමන් මෙරටට පැමිණීමෙන් පසු ඇති වූ කලා ප්‍රබෝධය පිළිබඳ විස්තර කරන්න.

(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම්කර එහි වේෂ නිරූපණ ක්‍රම පිළිබඳ විස්තරයක් කරන්න.

07. රූපවාහිනී මාධ්‍ය, නර්තන කලාවේ උන්නතියට මෙන්ම පරිහානියට ද හේතු වී ඇත.

(i) රූපවාහිනිය මගින් විකාශනය වන නර්තන වැඩසටහන් 05ක් නම් කරන්න.

(ii) දේශීය නර්තන කලාවේ දියුණුව සඳහා රූපවාහිනිය යොදා ගත හැකි ආකාරය පිළිබඳ ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 S I - II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

### නර්තනය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (3) | 11. | (3) | 21. | (3) | 31. | (3) |
| 2. | (3) | 12. | (1) | 22. | (1) | 32. | (4) |
| 3. | (4) | 13. | (3) | 23. | (4) | 33. | (2) |
| 4. | (1) | 14. | (2) | 24. | (2) | 34. | (1) |
| 5. | (4) | 15. | (2) | 25. | (4) | 35. | (1) |
| 6. | (3) | 16. | (4) | 26. | (3) | 36. | (3) |
| 7. | (4) | 17. | (3) | 27. | (2) | 37. | (2) |
| 8. | (2) | 18. | (3) | 28. | (3) | 38. | (1) |
| 9. | (3) | 19. | (4) | 29. | (1) | 39. | (3) |
| 10. | (2) | 20. | (3) | 30. | (2) | 40. | (1) |

### II කොටස

01. (i) ටීකා
(ii) කොහොඹා කංකාරිය
(iii) හොරණෑව
(iv) කරදිය
(v) රහිත
(vi) මුසලඩි
(vii) චෙම්බු
(viii) ජේ. ඊ. සේදරමන්
(ix) I භරත නාට්‍ය සම්ප්‍රදාය II කථකලි නර්තන සම්ප්‍රදාය
(x) I කොහොඹා කංකාරිය II පහන් මඩුව

02. (i)

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | ^ | | / | | | ^ | | ^ | | / | | |
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| දොමි | තකු | දොමි | තකු | දොං | ජිං | - | ගත් | - | තත් | - | ජිං | තරි | කිට |

(ii)

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | / | | | / | | | / | | |
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| ර | තේ | - | රු | ව | සෙ | ව | ත | - | - | - | - |
| රු | වින් | - | දි | ලේ | - | දෝ | - | - | - | - | - |
| ර | නේ | - | බ | ර | ණ | ග | ත | - | - | - | - |
| ව | ට | ස | ර | සා | - | දෝ | - | - | - | - | - |
| ර | නේ | - | ඹ | ස | රි | පො | ට | - | - | - | - |
| නෙ | රි | ය | ත | බා | - | දෝ | - | - | - | - | - |
| ර | නේ | - | දො | තො | න | වි | ලි | - | - | - | - |
| මෝල් | - | - | ගෙ | නා | - | දෝ | - | - | - | - | - |

(iii)

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| තාම් | - | - | දො | මි | ති | ග | ත | දො | මි | කි | ට | කඩ | තක | තරි | කිට |
| කි | ත | ක | දො | මි | ති | ග | ත | සත් | - | තක් | - | කු | ද | කු | ද |
| තා | - | කු | ණ් | - | ත | ග | ත | දො | මි | කි | ට | කරි | කිට | කුං | දත් |
| කා | | | | | | | | | | | | | | | |

03. (i) ග්‍රහ පංති කවි

- බලි ශාන්ති කර්මයේදී ගැයෙන කවි විශේෂයක් බව
- නවග්‍රහයින් නම්කර ඔවුන්ට අයත් දිශා, විමාන, භෝජන, ආයුධ, දින පිළිබඳව මෙම ගායනාවල විස්තර වීම
- බලි ඇදුරා බෙර වාදනයට අනුව තාලානුකූලව ගයමින් සරල නර්තනයක යෙදෙන බව
- මෙම කවි වලින් ග්‍රහයන්ට ආරාධනා කිරීම හා ආතුරයට සෙත් පැතීම සිදුවන බව
- කවි උදාහරණ ලෙස දක්වා තිබීම ල. 04

(ii) සරල අංග රචනය

- අංගරචනය පිළිබඳ හැඳින්වීම
- රංග කාර්යයේදී ප්‍රයෝජනවත් වන බව
- භවිතයට ගන්නා ද්‍රව්‍ය හඳුනාගෙන විස්තර කර තිබීමට ල. 04

(iii) ආහාර්ය අභිනය

- පිටතින් ගන්නා සියලුම රංග වස්ත්‍රාභරණ, භාවිතය වෙස් ගැන්වීම වේදිකා උපකරණ, සැරසිලි, උපයෝග කර ගනිමින් භාවයන්ගේ ආර්ථිකය වඩාත් ඔපවත් කරනු ලබන්නේ ආහාර්ය අභිනයෙනි.
- නර්තනයක හෝ නාට්‍යයක එක් එක් චරිත වෙස් ගැන්වීම ද ආහාර්ය අභිනයට අයත්ය.
- ආහාර්ය අභිනයේ ප්‍රධාන අංශ දෙකකි.
  1. අංග රචනය
  2. වෙස් මෝස්තර නිර්මාණය

  යන කරුණු විස්තර කර ඇත්නම් ල. 04

(iv) හේවිසි වාදන

- බෞද්ධ සිද්ධස්ථානවල හා දේවාලවල බෙර වාදනයෙන් කරනු ලබන ශබ්ද පූජාවක් වන බව.
- මේ සඳහා දවුල, තම්මැට්ටම, හොරණෑව යොදා ගැනීම.
- මෙය සන්නිවේදන කටයුත්තක් බව
- පුද පූජා පවත්වන වේලා දින පිළිබඳ ජනතාවට දැනුම් දීම් කිරීම.
- අලුයම් ධූරය, මැදියම් ධූරය, හැන්දෑ ධූරය වැනි වාදන අංග
- දළදා වහන්සේ වෙනුවෙන් අඹරා හේවිසි හා ගෙවැදුම් හේවිසි පැවැත්වීම.

ල. 04

04. (i)

- පූජාර්ථය
- අධ්‍යයනය
- සශ්‍රීකත්වය
- සංරක්ෂණය
- විනෝදාස්වාදය
- සමාජ විවරණය හා සමාජ ශෝධනය

(ii) **සොකරි**

- මෙම නාටකයේ ප්‍රධාන කාන්තා චරිතය වන බව
- ඉතාමත් රූමත් තරුණියක් බව
- ඇගේ ගමන කලාත්මක, ලයාන්විත, ශෘංගාරාත්මක රසයක් මතුවන ආකාරයට බෙර පද හා ගායන විලාස සැකසී ඇතිබව
- කතා නොකරන බැවින් ඇස්වලින් ඉඟිබිඟි පාමින් ලැජ්ජාශීලී ලෙස හැසිරෙන ස්ත්‍රියක් බව පෙන්වීම
- කවි උදාහරණ ලෙස දක්වා තිබීම.
- ඇඳුම් පැළඳුම් පිළිබඳ දැක්වීම ල. 05

**ලෙංචිනා**

- කෝලම් රඟ මඬලේ දී දැකිය හැකි කාන්තා චරිතයක් බව
- රූමත් තරුණියක බව
- ඇය ජසයාගේ බිරිඳ වන බව
- කවි තුළින් ඇගේ චරිත ස්වභාවය විස්තර කර ඇති බව
- කඩිසරව තම වැඩකටයුතු කරන බව
- කවි උදාහරණ ලෙස දක්වා තිබීම
- ඇඳුම් පැළඳුම් පිළිබඳ දැක්වීම ල. 05

(iii) ගැමි නැටුම්

- ගැමියන් විසින් නිර්මාණය කරගත් ගැමි කලාවක් බව
- සරල බව, සාමූහිකත්වය, රංග මෙවලමක් භාවිතය, නිශ්චිත රංග වස්ත්‍රාභරණ නොමැති බව ජීවන වෘත්තීන් අතර සම්බන්ධතා ඇති බව
- සරල තාල පද්ධතියක් හා සරල මාත්‍රා යොදා ගනිමින් නිර්මාණය කිරීම

ල. 02

ගැමි නාටක

- කිසියම් තේමාවක් නොහොත් කිසියම් කතා ප්‍රවෘත්තියක් වටා ගොඩනැගීම
- දේශීය නර්තන සම්ප්‍රදායන්ගෙන් පෝෂණය ලබා තිබීම.
- සොකරි උඩරට නර්තන සම්ප්‍රදාය ද කෝලම් පහතරට සම්ප්‍රදායයෙන් පෝෂණය ලැබීම
- නර්තන ගායන වාදන හා දෙබස් ඇතුළත් වීම
- නිශ්චිත රංග මණ්ඩප හා රංග වස්ත්‍රාභරණ ඇති බව
- හාස්‍ය උපහාසය ඇතිබව
- පොදුවේ කතා තුළින් සමාජ විවරණයක් සිදුවන බව

අංශ දෙකේම කරුණු 4ක් හෝ ගෙන විස්තර කර ඇත්නම් ල. 05

05. (i) කප් සිටුවීම, මඩු පේ කිරීම, තොට පේ කිරීම, මිල්ල කැපීම බිසෝ කප් සිටුවීම, ආභරණ වැඩමවීම, පහන් දල්වීම ල. 02

(ii) වෙස් ඇඳුම් කට්ටලය

- මලය රජුගෙ ඇඳුමෙන් අර්ධයක් වන බව
- ඇඳුම් කට්ටලයේ කොටස් නම් කිරීම
- සැකසීමට ගෙන ඇති අමුද්‍රව්‍ය පිළිබඳ විස්තර කිරීම
- භාවිත වර්ණ වලින් සුදු පැහැයෙන් භක්තිය හා රතු පැහැයෙන් වීරත්වය ජනිත වන බව ල. 05

(iii)
- ශාන්ති කර්ම පැවැත්වීමේ දී එක් පුද්ගලයකුට එය තනිව කළ නොහැක.
- ශාන්ති කර්මයට අවශ්‍ය කළමනා, කැමබීම, ආදී සියළු කටයුතු සඳහා සැමදෙනාගේ සහය අවශ්‍ය බව.
- ගමේ සියළු දෙනා එකමුතුව සහයෝගය දීමෙන් කටයුතු කරන බව.
- කංකාරියේ දී ''බතබුලතේ යෑම'' නමින් ශාන්ති කර්මයට අවශ්‍ය බඩු බාහිරාදිය ගමෙන් එකතු කර ගැනීම.
- මඩු සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයාදීම, සැරසිලි සඳහා උදව් වීම.
- ශාන්ති කර්මය නැරඹීමට පැමිණෙන අයට සංග්‍රහ කිරීම.
- සියළු දෙනා බිම එලූ පැදුර මත හිඳ නැරඹීම. ආදී කරුණු විස්තර කර ලියා ඇත්නම් ල. 05

06. (i) රබීන්ද්‍රනාත් තාගෝර්තුමා

- 1934 හොරණ ශ්‍රී පාලි ආයතනයට මුල්ගල තැබීමට පැමිණීම.
- ඔහුගේ ''ශාප් මෝචන්' මුද්‍රා නාට්‍ය මෙරට නෘත්‍ය ශාලාවල වේදිකා ගත කිරීම.
- එය නැරඹීමෙන් පසු මෙරට කලා ප්‍රබෝධයක් ඇතිවීම.
- මෙරට සිටි ශිල්පීන් මෙම මුද්‍රා නාට්‍යවල රඟපෑම.
- මුද්‍රා නාට්‍ය රසවිඳිය හැකි ප්‍රේක්ෂක පිරිසක් බිහිවීම.
- ලාංකික ශිල්පීන්ට ඉන්දියාවට ගොස් ඉන්දීය නර්තන හා සංගීතය හැදෑරීමට හැකිවීම.
- ඒ තුළින් මෙරට උසස් කලාකෘති නිර්මාණය වීම.

කරුණු 5ක් ලියා ඇත්නම් ල. 05

නම් කිරීමට ල.01

(ii) කතකලි

වේෂනිරූපණ ක්‍රම 4ක් හෝ විස්තර කර තිබීම.

නම් කිරීමට - ල. 01

විස්තර කිරීමට - ල. 05

07. (i) කවිතා, සංචලන, රූපන, කමත, ලිට්ල්ස්ටාර්, ඩාන්සින් ස්ටාර්, සිටි ඔෆ් ඩාන්ස් යන 05ක් නම් කර ඇත්නම් . 05

(ii)
- දේශීය ශාන්තිකර්ම ප්‍රචාරය කිරීම සඳහා සංරක්ෂණය කිරීම.
- දේශීය නර්තන අංග ඇතුලත් වැඩසටහන් ප්‍රචාරය කිරීම.
- අධ්‍යාපනික වැඩසටහන් සකස් කළ යුතුයි.
- ශිල්පීන් හා විද්වතුන් සම්බන්ධකර වැඩසටහන් ඉදිරිපත් කිරීම.
- ප්‍රචාරය කිරීමට පෙර ගුණාත්මක බව පරීක්ෂා කිරීම. යන කරුණු 04ක් වත් තිබේ නම් ල. 07